# ආයෝජනයට සබරගමුව

# Invest to Sabaragamuwa



## සුලු හා මධ්‍ය පරිමාණ
## ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

## 2021 - 2024


**යෝජනාව හා ඉදිරිපත් කිරීම**
**විශේෂ ව්‍යාපෘති හා දත්ත තොරතුරු දෙපාර්තමේන්තුව**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය**
**සබරගමුව පළාත් සභාව**

1. හැඳින්වීම

ලෝකය වෙනස් කරන නව්‍යකරණයේ සමාරම්භය සිදුවනු ලබන්නේ පුද්ගලයෙකු තුල ඇති වන ව්‍යවසායකත්වය නම් වූ පරිකල්පනීය ඥානය තුලිනි. මිනිසා තුල සැගවුණු මෙම ලාභය මුල්කොටගත් පරිකල්පනීය ඥානය භාවිතා කරන්නා අප "ව්‍යවසායකයා" ලෙස අර්ථ ගන්වනු ලබයි.
ලාභ අපේක්ෂාව පෙරදැරිව ඔහු සැම විටම ආයෝජනයන් කරනු ලබයි.

ලෝකයේ ව්‍යවසායකත්වය ප්‍රධාන වශයෙන් අංශ 03ක් යටතේ විහිදී පවතිනු ලැබේ. ඒ අනුව මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුලු පරිමණ ක්ෂුද්‍ර ව්‍යවසාය ලෙස වර්ගීකරණය කළ හැකිය. ශ්‍රී ලංකාව තුලද මේ ව්‍යවසායකත්ව වර්ගීකරණය එසේම වන අතර "Invest Sabaragamuwa" ව්‍යාපෘතිය තුල අපගේ මුලික අවධානය යොමුවන්නේ සබරගමුව පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය පිළිබඳවයි.

ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ බොහො දියුණු ආර්ථිකයන් තුල සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය (SMEs) ඉතාම වැදගත් කාර්යභාර්යයක් ඉටු කරනු ලබයි. විශේෂයෙන් දියුණු ආර්ථිකයන්ට හිමිකම් කියන යුරෝපියානු සංගමයේ (EU) රටවල මෙම SMEs අංශයේ දායකත්වය 50% වඩා ඉහල අගයක් ගනු ලැබේ. එලෙසම OPED රටවල මෙම සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් තුලින් දළ දේශීය නිශ්පාදිතයන්ට දක්වන දායකත්වය 99% තරම් ඉහල අගයක් ගනු ලබනවා. ඕනම රටක ආර්ථිකයේ ජීවනාලිය එහි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ දායකත්වයයි.

ලෝක තත්වය එසේ වුවත් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන් බිහිවීමේ ප්‍රවණතාව ඉතාමත් අඩු මට්ටමක පවතින අතර ආකල්ප හා ව්‍යාපාරික අවස්ථා හදුනා නොගැනිම, මුල්‍ය හැකියාවන් අවම මට්ටමක පැවතීම හා සහය ලබාගැනිම සඳහා ක්‍රමවේද දියුණු නොවිම හේතුකොට ගෙන ශ්‍රී ලංකායේ ව්‍යවසායකත්ව එක්තැනම නතර වී තිබේ.

අතිගරු ජනාධිපති තුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුල රටක ආර්ථික සංවර්ධනය ඇති කිරිම සඳහා ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ අංශ වලින් සැපයිය හැකි සෘජු දායකත්වය පිළිබඳ මැනවින් විග්‍රහ කර ඇත.

"සම්පත් සිමිතයි - එහෙත් නිර්මාණශිල්පය හා නව්‍යකරණය අසීමිතයි" යන තේමාව මුල් කොට ගෙන සබරගමුව පළාතේ ක්‍රියාත්මක වන හා ආරම්භ කිරිමට අපේක්ෂිත සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඉලක්ක කොට ගෙන මෙම "Invest Sabaragamuwa" සුලු හා මධ්‍ය පරිමාණ වැඩසටහන ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත. ශ්‍රී ලංකාවේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය කෙබඳු ස්ථානයක් ගනු ලබන්නේද පිළිබඳව අපි සොයා බැලිය යුතුව පවති.

ශ්‍රී ලංකාව තුල මේ සඳහා සිදුකර ඇති ආසන්නතම සමීක්ෂණය වන ජන ලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සමීක්ෂණය 2013/14 පිළිබඳව අවධානය යොමු කර බලමු.

ශ්‍රී ලංකාවේ සමස්ත ක්ෂුද්‍ර, සුලු, මධ්‍ය හා විශාල ප්‍රමාණයේ ව්‍යවසායන් සංඛ්‍යාව මිලියන 1.017කි. මේ බව අපට වගු අංක 01 තුලින් පෙන්වාදිය හැකිය. එලෙසම උක්ත සංගණනය අනුව ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය ව්‍යවසාය තුල මිලියන 2.25 අධික ශ්‍රමිකයන් සංඛ්‍යාවක් රැකියා ගතව සිටිනු ගැබේ. (වගු අංක 03)

වගු අංක 01: ව්‍යවසායක කාණ්ඩ අනුව කර්මාන්ත වල විහිදිම.

| ව්‍යවසාය වර්ගය | සමස්ත කර්මාන්ත ගණන | | වෙළඳ | සේවා | කර්මාන්ත |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | | | |
| ක්ෂුද්‍ර | 935736 | 91.8 | 25.3 | 42 | 32.7 |
| සුලු | 71126 | 7.0 | 28.8 | 31.6 | 39.9 |
| මධ්‍ය | 10405 | 1.0 | 32.00 | 19.6 | 48.4 |
| විශාල | 2414 | 0.2 | 31.6 | 36.9 | 31.5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සමස්ත | 1019681 | 100 | 25.6 | 41 | 33.4 |

මුලාශ්‍රය - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ව්‍යවසායකයන් වර්ග කිරිමේදී ඒ හා සම්බන්ධිත ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විසින් ක්ෂුද්‍ර, සුලු, මධ්‍යම ලෙස වර්ගීකරණය කර ඇති ආකාරය ඒ ඒ ආයතන වල විෂය පරාසයන් අනුව එකිනෙකට වෙනස් වේ. ඒ බව පහත වගු අංක 02 යටතේ දක්වා ඇති නිර්වචනයන්ගෙන් අපට මනාව පැහැදිලි වේ.

වගු අංක 01: සුලු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය පිළිබඳ විවිධ ආයතන විසින් සිදුකර ඇති නිර්වචනයන්

| අනු අංකය | ආයතනය | නිර්නායකය | මධ්‍ය පරිමාණ | සුලු හා ක්ෂුද්‍ර පරිමාණ |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) | යෙදී සිටින සේවක සංඛ්‍යාව | සේවකයින් 50-249 | සේවකයින් 50 අඩු |
| 02 | කාර්මික සංවර්ධන මණ්ඩලය | යොදාගෙන ඇති යන්ත්‍ර වල වටිනාකම | රු. මිලියන 4-10 | මිලියන 04ට අඩු |
| 03 | කර්මාන්ත අමාත්‍යාංශය | ස්ථාවර වත්කම් වල අගය | මිලියන 16ට වැඩි | මිලියන 16 අඩු |
| 04 | වෙළඳ හා කර්මාන්ත වාණිජ මණ්ඩලය - ශ්‍රී ලංකාව | සේවකයින් වෙනුවෙන් දරණ ප්‍රාග්ධනය | මිලියන 02 සිට මිලියන 20 දක්වා | මිලියන 16 අඩු |
| 05 | කුඩා කර්මාන්ත අමාත්‍යාංශය | සමස්ත ආයෝජන | මිලියන 20-50 අතර | මිලියන 02 අඩු |
| 06 | ජාතික කර්මාන්ත සංවර්ධන මණ්ඩලය | ස්ථාවර වත්කම් අගය හා කාර්ය මණ්ඩලය | මිලියන 4-20 දක්වා සේවකයින් 10-50 දක්වා | මිලියන 20-01 අඩු |
| 07 | අපනයන සංවර්ධන මණ්ඩලය | සමස්ථ ප්‍රාග්ධන ආයෝජන හා අපනයන පිරිවැටුම | මිලියන 40ට වැඩි හා මිලියන 100ට වැඩි පිරිවැටුමක් සහිත | මිලියන 20 අඩු මිලියන 100ට අඩු පිරිවැටුමක් සහිත |
| 08 | ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව | සේවකයින් සංඛ්‍යාව අනුව | සේවකයින් 25 වැඩි | සේවකයින් 25ට අඩු |

මුලාශ්‍රය - 2019-24 පස් අවුරුදු ඒකාබද්ධ සැලැස්ම - සබරගමුව පළාත් සභාව

වගු අංක 01: ව්‍යවසායන් තුල ශ්‍රම බලකායේ ව්‍යාප්තිය

| විශාලත්වය අනුව වර්ගීකරණය | රැකියාගත වූ පුද්ගලයින් | | අංශ අනුව රැකියා ගත විමේ බෙදියාම | | |
|---|---|---|---|---|---|
| | ගණන | ප්‍රතිශතය | කර්මාන්ත | වෙළඳ | සේවා |
| ක්ෂුද්‍ර | 1338675 | 44.6 | 29.7 | 68.1 | 44.6 |
| සුලු | 529751 | 17.6 | 14.00 | 16.8 | 22.6 |
| මධ්‍යම | 386756 | 12.9 | 16.7 | 5.5. | 13.9 |
| විශාල | 747937 | 24.9 | 39.6 | 9.5 | 18.9 |
| සමස්ත | 3003119 | 100 | 100 | 100 | 100 |

මුලාශ්‍රය - කර්මාන්ත සමික්ෂණය, ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමෙන්තුව - 2013/14

ශ්‍රී ලංකාවේ කර්මාන්ත සමීක්ෂණය 2013/14 අනුව කර්මාන්ත තුල යෙදී ඇති සමස්ත ශ්‍රමබලකායෙන් 75.1% යෙදී සිටිනු ලබන්නේ ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත තුලය. එලෙසම සමස්ත ව්‍යවසාය සංඛ්‍යාවෙන් 99.8% නියෝජනය කරනු ලබන්නේ ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය මට්ටමේ ව්‍යවසාය බව අපට ඉහත වගුව තුලින් මැනවින් විද්‍යාමාන වේ. ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාවලිය සඳහා කෙතරම් දායකත්වයක් ලබාදෙනවාද යන්න මේ මගින් මනාව පිළිබිඹු වේ.

ජාතික මට්ටමේ මෙන්ම සබරගමු පළාත තුලද සුලු මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා සේවා නියුක්තිය පිළිබඳ පහත පරිදි අවධානය යොමු කල හැකිය.

වගුව අංක 04 : දිස්ත්‍රික්ක අනුව සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු

| අනු අංක | දිස්ත්‍රික්කය | ව්‍යවසායකත්ව සංඛ්‍යාව | ප්‍රතිශතය % | සේවක රැකියාගත වීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ | 135998 | 13.3 | 700638 | 23.3 |
| 02 | ගම්පහ | 127734 | 12.5 | 493476 | 16.4 |
| 03 | කුරුණෑගල | 86788 | 8.5 | 211613 | 7.0 |
| 04 | මහනුවර | 62062 | 6.1 | 168057 | 5.6 |
| 05 | කලුතර | 60717 | 6.0 | 165470 | 5.5 |
| 06 | ගාල්ල | 48584 | 4.8 | 132968 | 4.4 |
| 07 | රත්නපුර | 45210 | 4.4 | 120250 | 4.0 |
| 08 | පුත්තලම | 44894 | 4.4 | 106288 | 3.5 |
| 09 | අනුරාධපුර | 43715 | 4.3 | 98858 | 3.3 |
| 10 | මාතර | 43423 | 4.3 | 100586 | 3.3 |
| 11 | කෑගල්ල | 35452 | 3.5 | 79355 | 2.6 |
| 12 | යාපනය | 35128 | 3.3 | 70698 | 2.4 |
| 13 | හම්බන්තොට | 31688 | 3.1 | 70283 | 2.3 |
| 14 | බදුල්ල | 30757 | 3.0 | 70091 | 2.3 |
| 15 | අම්පාර | 30550 | 3.0 | 59470 | 2.0 |
| 16 | මඩකලපුව | 29135 | 2.9 | 53732 | 1.8 |
| 17 | මාතලේ | 25784 | 2.5 | 61192 | 2.0 |
| 18 | නුවරඑළිය | 24779 | 2.4 | 70381 | 2.0 |
| 19 | පොලොන්නරුව | 21030 | 2.1 | 47820 | 1.6 |
| 20 | මොණරාගල | 18846 | 1.8 | 40513 | 1.3 |
| 21 | ත්‍රිකුණාමලය | 16565 | 1.6 | 31726 | 1.1 |
| 22 | වවුනියාව | 7351 | 0.7 | 18676 | 0.6 |
| 23 | කිලිනොච්චිය | 6238 | 0.6 | 14715 | 0.5 |
| 24 | මන්නාරම | 4481 | 0.4 | 8277 | 0.3 |
| 25 | මුලතිව් | 4122 | 0.4 | 7986 | 0.3 |
| | එකතුව | 1019681 | 100 | 3003119 | 100 |

මූලාශ්‍රය - කෘෂිකර්මාන්තය ආර්ථික ක්‍රියාකාරකම් සමීක්ෂණය - 2013/2014

එලෙසම සබරගමු පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳව සලකා බලන කල ජාතික වශයෙන් රත්නපුර දිස්ත්‍රික්ක 07 ස්ථාන තුලින්, කෑගල්ල දිස්ත්‍රික්කට හා ස්ථානය තුලින් ස්ථානගතව තිබේ.

“අයෝජනයට සබරගමුව” (Invest Sabaragamuwa) වැඩසටහන යටතේ සබරගමුව පළාතේ ව්‍යවසායකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටලු කිහිපයකට විසඳුම් ලබා දීමට සැලසුම් කර ඇත. ඒ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවනු ඇත.

i. ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන්ට අදාල සහතිකකරණ ක්‍රියාවලිය සඳහා සහය වීම. (Certification and Stadatiation).
ii. අගය එකතු කල නිශ්පාදන ප්‍රවර්ධනයට පියවර ගැනිම. (Value Added Product Development)
iii. නිෂ්පාදන වැඩිදියුණු කිරිම සඳහා සහාය වීම. (Technology Transferring)
iv. අලෙවිකරණ උපදේශකත්වය හා අලෙවිජාල සංවර්ධනය/ සන්නාමකරණයට සහය විම.
v. (Marketing consultation, Marketing Linkage Development and Brand Management)
vi. නව්‍යකරණ ව්‍යවසාය සංවර්ධනය සඳහා සහාය වීම. (Innovation Products Development)
vii. මුල්‍ය ආයතන සම්බන්ධීකරණය හා ව්‍යාපෘති වාර්තා සැකසිම.
viii. ඇසුරුම්කරණ ක්‍රියාවලි වැඩිදියුණු කිරිම. (Packaging Process Development)
ix. ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය/ හුදකලාවූ කණ්ඩායම් නඟාසිටුවිම (Skill Development/ Gender and Vulnerable Groups)
x. අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත සංවර්ධනය. (Export Oriented Products Development)
xi. ව්‍යාපෘතිවලට අදාල නෛතික ගැටලු විසඳාලීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සබරගමුව පළාතේ කෘෂි, කාර්මාන්ත, සංචාරක, කාන්තා ව්‍යවසාය වැනි ක්ෂේත්‍ර වල යෙදිසිටින ව්‍යවසායකයන් 2000 වසර 04ක් ඇතුලත අදියර 04ක් යටතේ සංවර්ධනයට අදාල ක්‍රියාමාර්ග ගැනිමට සැලසුම් කර ඇත.

## 2. ව්‍යාපෘති බල ප්‍රදේශය

සබරගමුව පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා සැලසුම් කර ඇත.



සබරගමුව පළාත කැගල්ල හා රත්නපුර ලෙස පරිපාලන දිස්ත්‍රික්ක 02 පවතින අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 28ක් ඇතුලත් වේ.

වර්ග කිලෝමීටර් 4968 සැදුම්ලත් සබරගමුව පළාත ශ්‍රී ලංකාවේ පළාත් අතර විශාලත්වයෙන් 7 ස්ථානය හිමිකරගෙන ඇත. ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දත්ත අනුව 2019 වර්ෂයේ පළාතේ ඇස්තමේන්තුගත ජනගහණය 2058000ක් වේ. ඉන් 1171000 රත්නපුර දිස්ත්‍රික්කය තුලද 887000 කැගල්ල දිස්ත්‍රික්කය තුලද ජීවත් වේ.

## 3. අවශ්‍යතා අධ්‍යනය -

### 3.1. විධිමත් වැඩපිලිවෙලක අවශ්‍යතාවය -

ජන ලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් 2013/14 වර්ෂයේ අවසන් වරට කරනු ලැබූ කර්මාන්ත සංගණනය අනුව සබරගමුව පළාතේ ක්ෂුද්‍ර සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය 80662 පවතින බව සංගණනයට වාර්තා වී ඇත. (04 වගුව) එලෙසම එම ව්‍යාවසාය තුල පුද්ගලයින් 199605 සේවය කරනු ලැබේ. ඒ අනුව සලකා බලන කල පළාතේ සමස්ත ජනගහණයෙන් 9.69% පමණ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සේවයේ යෙදී සිටි. එබැවින් මෙම ක්ෂේත්‍රයේදි සංවර්ධනය කිරිම සඳහා විධිමත් වැඩපිළිවෙලක කාලීන අවශ්‍යතාවයක් පවතී.

### 3.2. ව්‍යාපාර වල ගුණාත්මකතාවය ඉහල නැංවීම.

සබරගමුව පළාතේ බොහොමයක් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳව අවධානය යොමු කරන කල බොහොමයක් ව්‍යවසායන් සිය ප්‍රාථමික අදියර පසු කර ඇති ව්‍යාපාර ලෙස හඳුනාගත හැකිය. මෙම සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින් වෙළඳපල ජයගැනිමට හා මහා පරිමාණ නිශ්පාදන හා වෙළඳපල තරඟකරුවන් සමඟ ගැටිමට සිදුවේ.
එහිදි ඔවුන් හට සිය භාණ්ඩ වල ගුණාත්මකභාවය ඉහල නැංවිම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරිමට සිදුවේ. ඒ යටතේ ඔවුන්ගේ නිෂ්පාදන සහතිකකරණය, සන්නාමකරණය, තාක්ෂණිය පැවරුම් ක්‍රියාවලි, ක්‍රියාවලි වැඩිදියුණු කිරිම, නව්‍යකරණ ක්‍රියාවලි හා අපනයන වෙළඳපල ඉලක්ක කරගත් නිෂ්පාදන සිදුකිරිමට සානුබලයන් ලබාදීම අත්‍යවශ්‍ය දෙයකි. එබැවින් පළාතේ ව්‍යවසාය ප්‍රවර්ධනය හා නව ව්‍යවසාය සංවර්ධනය සඳහා එවැනි ක්‍රියාමාර්ග ගැනිම අත්‍යවශ්‍ය කරුණකි.

## 4. ව්‍යාපෘති අරමුණු

### 4.1. සංවර්ධන අරමුණු (Development Objectives) –

i. සබරගමුව පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මුහුණදෙන ගැටලු සඳහා වියදම් ලබා දීම තුලින් ඔවුන්ගේ නිශ්පාදන ධාරිතාව හා අලෙවිකරණ ධාරිතාව ඉහල නැංවිම තුලින් පළාතෙන් දළ දේශීය නිශ්පාදිතයට ඉහල දායකත්වයක් ලබාදිම.
ii. සබරගමුව පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ අදායම් ඉහල නැංවිම තුලින් රැකියා අවස්ථා, ජනනය කරමින් තිරසර, නව්‍යකරණය වූ ව්‍යාවසාය සංස්කෘතියක් පළාත තුල නිර්මාණය කිරිම.

### 4.2. සුවිශේෂී අරමුණු (Specific Objectives)

i. සබරගමුව පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහතිකකරණය, සන්නාමකරණය, වෙළඳපල ජාල ගොනනැංවීම, තාක්ෂණික පැවරුම් ක්‍රියාවලිය, ඇසුරුම්කරණය, නිෂ්පාදන නව්‍යකරණය, අවසාන ඉලක්ක කොට ගත් ගුණාත්මක නිමවුම් සිදුකිරීම හා ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වාදීම දක්වා ඒකාබද්ධ වූ සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම.

ii. සබරගමුව පළාතේ ආයෝජන කිරීම සඳහා සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පෙළඹ වීම.

iii. සබරගමුව පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන මූල්‍ය ගැටලුවලට මහජන බැංකුව, ලංකා බැංකුව, රාජ්‍ය බැංකු හා පෞද්ගලික බැංකු වලින් මූල්‍ය දායකත්වය ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණය ලබාදීම.

iv. සබරගමුව පළාතේ සුලු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන හා සේවා වලට අලෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා “Sabaragamuwa Hub” ස්ථාපිත කිරීම හා අලෙවිජාලගොඩ නැංවීම.

v. සබරගමුව නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධනය සඳහා Sabaramarket.lk නම් වූ අන්තර්ජාල අලෙවි ජාලයක් නිර්මාණය කිරීම තුලින් භාණ්ඩ හා සේවා සඳහා විද්‍යුත් වෙළඳපලක් නිර්මාණය කර දීම.

## 5. ව්‍යාපෘති සාධාරණීකරණය

### 5.1. සබරගමුව පළාත මුහුණ දෙන දූගීභාවය පිළිබඳ ගැටලුවට සෘජු විසඳුම් ලබාදෙන වැඩසටහනක් වීම.

සබරගමුව පළාත සංවර්ධනය කිරීමේදී මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත්තේ පළාතේ දූගීභාවයයි. පළාතේ සමස්ත ගෘහ කාණ්ඩ අතර ආදායම් බෙදියාම සම්බන්ධිත ප්‍රතිශතක ව්‍යාප්තිය පහත වගුව තුළින් ඔබගේ අවධානය යොමුකර වීමට කැමැත්තෙමි.

වගු අංක 05: දූප්පත් හා පොහොසත් ගෘහ කාණ්ඩ අතර ආදායම් බෙදියාමේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2016

| පළාත/ දිස්ත්‍රික්කය | අදායම් බෙදියාම | | |
|---|---|---|---|
| | දූප්පත් 20% | මධ්‍යම 60% | පොහොසත් 20% |
| බස්නාහිර | 5.3 | 43.4 | 51.2 |
| මධ්‍යම | 5.2 | 47.2 | 47.5 |
| දකුණ | 5.6 | 46.2 | 48.2 |
| උතුර | 4.3 | 47.3 | 48.2 |
| නැගෙනහිර | 5.2 | 47.2 | 47.6 |
| වයඹ | 4.5 | 44.0 | 51.5 |
| උතුරුමැද | 4.7 | 43.7 | 51.6 |
| ඌව | 4.3 | 45.9 | 49.8 |
| සබරගමුව | 5.5 | 47.5 | 47.0 |
| රත්නපුර | 5.6 | 47.5 | 47 |
| කෑගල්ල | 5.5 | 47.4 | 47.1 |
| ශ්‍රී ලංකාව | 4.8 | 44.4 | 50.8 |

මූලාශ්‍රය - ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - ගෘහ ඒකක ආදායම්/ වියදම් සමීක්ෂණය

ඒ අනුව සලකා බලන විට පෙනියන්නේ පළාතේ දුප්පත් ගෘහ කාණ්ඩ 20% අතර සමස්ත ආදායම 5.5 ප්‍රමාණයක් විහිදී පවතී. එලෙසම මධ්‍ය ගෘහ කාණ්ඩ 60% අතර ආදායම් 47.5% බෙදියනු ලැබේ. එලෙසම පළාතේ පොහොසත් ගෘහ කාණ්ඩ 20% අතර ආදායමින් 47% බෙදියනු ලැබේ. මේ අනුව සලකා බලන කල සබරගමුව පළාතේ විෂම තුලිත ආදායම් බෙදීමක් දක්නට ලැබේ. එලෙසම පළාතේ දරිද්‍රතා දර්ශකය 6.7කි. එලෙසම පළාතේ නිල දරිද්‍රතා රේඛාවෙන් පහල සිටින දිළිඳු ගෘහ කාණ්ඩ සංඛ්‍යාව 29993කි. එම ගෘහ කාණ්ඩ තුල 133149 ජනගහනයක් ජීවත්වනු ලැබේ. (වගුව 06) මෙම "ආයෝජන සබරගමුව" (Invest Sabaragamuwa) ව්‍යාපෘතිය හේතු කොට ගෙන පළාතේ රැකියා මාර්ග උත්පාදනය හා ආදායම් මාර්ග නිර්මාණය වීමක් සිදුවේ. ඒ තුලින් ජනතාවගේ දුගීභාවය අවම කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වගුව 06 : දරිද්‍රතාවය පිළිබඳ තොරතුරු - 2016

| පළාත/ දිස්ත්‍රික්කය | ජනගහණ දරිද්‍රතා දර්ශකය | දිළිඳු ගෘහ කාණ්ඩ සංඛ්‍යාව | දිලිදු ගෘහ කාණ්ඩ ප්‍රතිශතය | දිළිඳු ජනතාව | සමස්ත දරිද්‍රතා වයට දායකත්වය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 4.1 | 169392 | 3.1 | 843913 | 100 |
| සබරගමු පළාත | 6.7 | 26993 | 5.1 | 133149 | 15.8 |
| රත්නපුර | 6.5 | 14737 | 4.8 | 72715 | 8.6 |
| කෑගල්ල | 7.1 | 12256 | 5.4 | 60435 | 7.2 |

මුලාශ්‍රය - ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
ගෘහස්ථ ආදායම් වියදම් සමීක්ෂණය - 2016

## 5.2 තරුණ විරැකියාව-

සබරගමු පළාත මුහුණ දෙන තවත් ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත්තේ තරුණ විරැකියා ගැටලුවයි.

සබරගමුව පළාතේ සමස්ත රැකියා විරහිතභාවය පිළිබඳව සලකා බලන කල එහි ප්‍රතිශතික ව්‍යාප්තිය පහත ආකාරයට අපට පෙන්වා දිය හැකිය.

වගු අංක 07: රැකියා විරහිත භාවය පිළිබඳව තොරතුරු 2016-2019

| විස්තරය | රැකියා වියුක්ති අනුපාතය | | | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2019 |
| රත්නපුර | 4.4 | 3.2 | 3.3 | 4.2 |
| කෑගල්ල | 6.9 | 4.3 | 5.6 | 4.7 |
| සබරගමුව පළාත | 5.5 | 3.7 | 4.3 | 4.2 |
| ශ්‍රී ලංකාව | 4.4 | 4.2 | 4.4 | 4.8 |

මුලාශ්‍රය - ශ්‍රමබල සමීක්ෂණ වාර්තාව - 2016/17/18/19

මෙහිදී පළාතක් ලෙස සියලුම වයස් කාණ්ඩ වල විරැකියා අනුපාතය 4.4 අගයක පැවතියත් පළාතේ තරුණ විරැකියා අනුපාතය ඉහල අගයක් ගෙන තියේ.

වගුව අංක 08 : තරුණ විරැකියාව පළාත් මට්ටමින්. 2019

| පළාත | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 14.3 | 15.9 | 14.7 | 13.7 | 12.9 | 15.0 |
| මධ්‍යම | 23.9 | 25.5 | 26 | 24.5 | 31.3 | 28.2 |
| දකුණ | 28.4 | 27.9 | 30.3 | 25.7 | 29.3 | 31.5 |
| උතුර | 19.1 | 18.8 | 24.7 | 26.6 | 19.8 | 17.4 |
| නැගෙනහිර | 16.4 | 21.7 | 20.1 | 16.1 | 22.6 | 21.3 |
| වයඹ | 21.3 | 15.2 | 16.0 | 15.2 | 19.7 | 19.9 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උතුරු මැද | 13.6 | 16.3 | 19.7 | 17.3 | 24.5 | 19.4 |
| ඌව | 21.1 | 22.0 | 24.8 | 20.3 | 28.0 | 23.8 |
| සබරගමුව | 30.9 | 29.6 | 30.0 | 18.3 | 21.1 | 25.2 |

මුලාශ්‍රය - ශ්‍රම බලකා සමීක්ෂණය - 2019
ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

එබැවින් පාසැල් හැරගිය තරුණ තරුණියන් ව්‍යාවසායකයින් ලෙස හා අදාල ආයතන වල ශ්‍රමිකයන් සඳහා යොදවා ගැනිමට මේ තුලින් අපේක්ෂා කරනු ලබන හෙයින් තරුණ විරැකියාව ප්‍රමාණාත්මකව අවම කිරිමේ වැඩසටහනක් ලෙස පෙන්වාදිය හැක.


**5.3 රාජ්‍ය ප්‍රතිපත්ති තුල ඉහල අවධානයක් යොමු වු වැඩසටහනක් වීම.**

අතිගරු ජනාධිපති තුමා ප්‍රමුඛ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය වන “රට හදන සෞභාග්‍යයේ දැක්ම” ජාතික ප්‍රතිපත්ති රාමුව තුල සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන සඳහා ඉහල වැදගත්කමක් ලබාදි ඇත. අතිගරු ජනාධිපතිතුමා විසින් ග්‍රාමීය ආර්ථික සංවර්ධන වැඩසටහන තුල ඒ සඳහා වෙන් වූ ජීවනෝපාය සංවාර්ධන කමිටුවක් වෙන් කිරිම මඟින් හා ගම සමඟ පිළිසඳරක් වැඩසටහන තුල සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට ලබා ඇති බර තැබිම තුළින් ඒ බව අපට මනාව පිලිබිඹු වේ.

එලෙසම සබරගමුව පළාත් සභාවද 2019-2023 පස් අවුරුදු ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම තුල මේ සඳහා වෙනම පරිච්ඡේදයක් වෙන් කරමින් අදාල තාක්ෂණික මඟ පෙන්විම සිදුකර ඇත. (පිටු අංක 170-185)

ඒ අනුව මධ්‍යම රජයේ හා පළාත් සභාවේ ප්‍රතිපත්ති රාමුන් තුල සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉහල වැදගත්කමක් හිමිකර දි ඇත. එබැවින් සබරගමුව පළාත් සභාව මෙම වැඩසටහන් ක්‍රියාවට නැංවිම තුලින් මධ්‍යම රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව තුල දක්වා ඇති කරුණු ඉටු කර ගැනිමට පළාත් මට්ටමින් ප්‍රභල දායකත්වයක් සපයනු ලැබේ.



## 6. අපේක්ෂිත උපාය මාර්ග

"ආයෝජනයට සබරගමුව" (Invest Sabaragamuwa) සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (2021-2024) යටතේ පළාතේ විසිරි පවතින ව්‍යාවසායකයන්ට හා සබරගමුව පළාතේ ආයෝජනයට සුදානම් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරිම අරමුණක් ක්‍රියාවට නැංවිමට සැලසුම් කර ඇත. මේ වැඩසටහන යටතේ දළ දේශීය නිෂ්පාදනය පළාතේ ඉහල දායකත්වයක් ලබාදිම හා ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය ඉහල නැංවිමට අදාල පියවර රාශියක් ගැනිමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන ක්‍රියාවට නැංවිමේදි පහත සඳහන් උපායමාර්ග කෙරෙහි ඉහල අවධානයක් යොමුකරලීමට අපේක්ෂා කර ඇත.

### 6.1.විධිමත් සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරිම හා පසු විමසුම් ක්‍රියාවලිය

"ආයෝජනය සබරගමුව" (Invest Sabaragamuwa) සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව0 වැඩසටහන වු කලී පළාතේ ක්‍රියාත්මක ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලබාදීම හා නව ව්‍යාපාරකරණයට ප්‍රවේශවන්නන් සඳහා අවශ්‍ය මඟපෙන්විම ලබාදීම සඳහා ක්‍රියාවට නංවනු ලබන වැඩසටහනකි. මෙම වැඩසටහන සැලසුම්කරණ සම්බන්ධව ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ඇති නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය කටයුතු කරනු ලබන අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් කර්මාන්ත අමාත්‍යාංශය, ප්‍රධාන අමාත්‍යාංශය හා සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාවට නැංවිමට සැලසුම් කර ඇත. එලෙසම අදාල අමාත්‍යාංශ ඒකාබද්ධව මෙම වැඩසටහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය මඟින් පසු විමසුම හා ඇගයිම් කරනු ලබයි. එලෙසම මෙම වැඩසටහන සැලසුම්කරණ ක්‍රියාවලියේදි සබරගමුව විශ්ව විද්‍යාලය තාක්ෂණික දායකත්වය යටතේ සකස් කරන ලද 2019-2023 පස් අවුරුදු ඒකාබද්ධ සංවර්ධන සැලැස්මේ පෙන්වා දි ඇති තාක්ෂණික කරුණු කෙරෙහි පූර්ණ අවධානය යොමු කර ඇත. එමෙන්ම සබරගමු විශ්ව විද්‍යාලය මෙහි තාක්ෂණික පාර්ශවකරුවෙකු ලෙස සහභාගි කර ගැනිමට කටයුතු කර ඇත.

### 6.2. **ක්ෂුද්‍ර, සුලු, හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට අදාල නව ක්ෂේත්‍ර හඳුන්වාදීම.**

"සම්පත් සීමිතයි එහෙත් නිර්මාණශිලීත්වය හා නව්‍යකරණය අසිමිතයි" යන තේමාව මුල් කොට ගෙන මෙම වැඩසටහන ක්‍රියාවට නැංවිම සැලසුම් කර ඇත. මේ යටතේ සම්ප්‍රදායික ව්‍යවසායකත්ව සංවර්ධනය තුල අවධානය යොමු නොකල පහත අංශ කෙරෙහි අවධානය යොමු කොට ඇත.

i. ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සහතිකකරණ/ සම්මතකරණය (Certification and Standlization)
ii. අගය එකතු කල නිෂ්පාදනයන් ප්‍රවර්ධනය. (Value Added Product Development)
iii. නිෂ්පාදනය වැඩි දියුණු කිරිමේ තාක්ෂණික පැවරුම්.
iv. අලෙවි ජාල සංවර්ධනය/ සන්නාම කරණය/ අලෙවි උපදේශකත්වය (Marketing Consultation, Marketing Linkage Development, Brand Management)
v. නව්‍යකරණ ව්‍යවසාය සංවර්ධනය (Innovation Business Development)
vi. මුල්‍ය ආයතන සම්බන්ධීකරණය හා ව්‍යාපෘති වාර්ථා පිළියෙල කිරිම.
vii. ඇසුරුම් ක්‍රියාවලි වැඩිදියුණු කිරිම.
viii. ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය/ හුදකලා වු කණ්ඩායම් සංවර්ධනය.
ix. අපනයන ඉලක්ක කොට ගත් නිෂ්පාදන ඉහල නැංවිම.
x. ව්‍යාපෘති වලට අදාල නෛතික ගැටලු විසඳාලීම.
xi. කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය හා සවිබල ගැන්විම.

යන නව ඒකාබද්ධ වූ ව්‍යවසාය ක්‍රියාකාරකම් සඳහා මෙම ව්‍යාපෘතිය තුළින් පුලුල් සහයක් ලබාදීමට සැලසුම් කර ඇත.

### 6.3.ව්‍යවසායකත්වය සඳහා වූ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

මෙම ව්‍යවසායකත්ව වැඩසටහන හුදෙක්ම සාම්ප්‍රදායික ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් නොවන බැවින් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටලුවක් බවට පත්ව ඇති ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ. මේ තුළින් ව්‍යාපාර සඳහා වේදිකාවක් (Business Platform) නිර්මාණය කිරිමට සැලසුම් කර ඇත. ප්‍රධාන වශයෙන් මෙම ව්‍යාපෘතිය තුළින් පවත්නා ව්‍යවසාය තුල හා ආරම්භ කිරිමට අපේක්ෂිත ව්‍යවසාය තුල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනයට රුකුලක් ලබාදෙනු ඇත. ඒ හේතු කොට ගෙන මෙම ව්‍යාපෘතිය කෙරෙහි ව්‍යවසායකයන්ගේ රුචිකත්වයන් හා බැඳීමක් නිර්මාණය වේ යැයි අපෙක්ෂා කෙරේ.

### 6.4.අන්තර් ආයතන සම්බන්ධීකරණය

සබරගමුව පළාත් සභාව ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත මෙම වැඩසටහන හේතුකොට ගෙන අන්තර් ආයතන අතර සම්බන්ධීකරණයක් නිර්මාණය වේ. විශේෂයෙන් මූල්‍ය, තාක්ෂණික ආයතන, සහතික කරණයට දායක වූ ආයතන, ඇසුරුම්කරණයට සම්බන්ධිත ආයතන, අලෙවිකරණයට සම්බන්ධිත ආයතන හා නියාමන ආයතන මේ යටතේ එක් වේදිකාවක් තුලට ගොනු වීමක් දක්නට ලැබේ. (one stop platform) මේ හේතු කොට ගෙන ව්‍යවසායකයින්ට සේවා සැලසීම පහසුකරනු ලබන අතර සේවාවන් කාර්යක්ෂමව සඵලදායිව, ද්විත්වකරණයෙන් තොරව සැපයිමට හැකියාව ලැබේ.

### 6.5.මානව සම්පත් සංවර්ධනය

“ආයෝජනයට සබරගමුව” යන ව්‍යාපෘතිය සැබැවින්ම මානව සම්පත ප්‍රවර්ධනය සඳහා ඉහල බර තැබිමක් සිදුකිරිමට අපේක්ෂිත වැඩසටහනකි. මේ යටතේ සම්බන්ධිත ව්‍යවසායකයන් හට ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය, තාක්ෂණික පැවරුම් ක්‍රියාවලිය, ඇසුරුම්කරණය හා අලෙවිකරණය, තත්ව කළමණාකරණය ක්ෂේත්‍ර ඉලක්ක කොටගෙන පුහුණු වැඩසටහන් ගණනාවක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ තුළින් ඉහල මානව සම්පත් සංවර්ධනයක් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් තුල ඇති කිරිමට කටයුතු කරනු ලැබේ. මේ හේතු කොට ගෙන ගුණාත්මකතාවයෙන් යුතු නිෂ්පාදනයක් හො සේවාවක් ව්‍යවසායකයන් තුළින් නිර්මාණය වේ යැයි අපේක්ෂා කරනු ලැබේ.

## 7. යෝජිත ක්‍රියාකාරකම් හා වගකීම් දරණු ලබන පාර්ශව

| අනු අංකය | හදුනාගත් ක්ෂේත්‍රය | හදුනාගත් ක්‍රියාකාරකම් | වගකිම දරණු ලබන පාර්ශවය |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති සැලැස්ම සැකසීම/ අනුමැතිය ලබාගැනිම. | i. ව්‍යාපෘති වාර්තා සැකසීම.<br>ii. මුදල් කොමිසම් සභාවේ එකඟතාවය ලබා ගැනීම. | ප්‍රධාන ලේකම් කාර්යාලය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය |

| | | | |
|---|---|---|---|
| 02 | ව්‍යවසායකයින් හදුනා ගැනිම | වර්ගීකරණය කරන ලද ක්ෂේත්‍ර සඳහා ක්ෂුද්‍ර, සුලු මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හදුනා ගැනිම | ආණ්ඩුකාර කාර්යාලය<br>ප්‍රධාන ලේකම් කාර්යාලය<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>පළාත් අමාත්‍යංශ<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 03 | සබරගමුව පළාත් සභාව තුල Business hub පිහිටුවීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය තුල ව්‍යවසායකයන් සම්බන්ධීකරණය සඳහා Business hub පිහිටුවිමට කටයුතු කිරිම.<br>කාර්යය මණ්ඩල යොමු කිරිම<br>කාර්යය මණ්ඩල පුහුණු කිරිම. | ප්‍රධාන ලේකම් කාර්යාලය<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය |
| 04 | ක්‍රියාවලි වැඩිදියුණු කිරිම | සහතිකකරණය අවශ්‍ය ව්‍යවසායකයන්ට සහතික/ තත්ව වාර්තා ලබා ගැනිමට සහය වීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>පළාත් කර්මාන්ත අමාත්‍යංශය<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යංශය<br>පළාත් සංචාරක අමාත්‍යංශය<br>තාක්ෂණික සේවා සපයන ආයතන |
| | | සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවශ්‍ය තාක්ෂණික පැවරුම් ක්‍රියාවලිය සිදු කිරිම. | තාක්ෂණික සේවා සපයන ආයතන සමාගම්<br>පළාත් කර්මාන්ත, කෘෂිකර්ම ප්‍රධාන හා සංචාරක අමාත්‍යංශය |
| | | අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්විම හා ප්‍රවර්ධනය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය<br>පළාත් කර්මාන්ත අමාත්‍යංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යංශය<br>පළාත් සංචාරක අමාත්‍යංශය<br>තාක්ෂණික සේවා සපයන ආයතන<br>පෞද්ගලික අංශය |
| | | විදේශ වෙළඳපල ඉලක්ක කර ගත් නිෂ්පාදන ප්‍රවර්ධනය | අපනයන සංවර්ධන මණ්ඩලය<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය |

| | | | |
|---|---|---|---|
| | | | පළාත් කර්මාන්ත අමාත්‍යාංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යාංශය<br>පළාත් සංචාරක අමාත්‍යාංශය<br>අපනයනයට ප්‍රවර්ධනය සිදුකරන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන |
| | | ආයාත ආදේශක කර්මාන්ත වල ව්‍යාවසායකයන් ප්‍රවර්ධනය | කාර්මික සංවර්ධන මණ්ඩලය<br>කුඩා ව්‍යාපාර අංශය<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පළාත් කර්මාන්ත අමාත්‍යාංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යාංශය<br>පළාත් සංචාරක අමාත්‍යාංශය |
| | | ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන සඳහා අලෙවිදාම (marketing Linkage Development) ගොඩනැඟිම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පළාත් කර්මාන්ත අමාත්‍යාංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යාංශය<br>පළාත් සංචාරක අමාත්‍යාංශය<br>කුඩා ව්‍යාපාර අංශය<br>විද්‍යාතා මධ්‍යස්ථාන |
| | | කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පළාත් කර්මාන්ත අමාත්‍යාංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යාංශය<br>පළාත් සංචාරක අමාත්‍යාංශය |
| | | ඇසුරුම්කරණය හා ක්‍රියාවලි වැඩිදියුණු කිරිම | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පළාත් කර්මාන්ත අමාත්‍යාංශය<br>පළාත් ප්‍රධාන අමාත්‍යාංශය<br>පළාත් සංචාරක අමාත්‍යාංශය<br>කාර්මික සංවර්ධන මණ්ඩලය<br>කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | | | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 05 | ප්‍රචාරන ක්‍රියාකාරකම් | විද්‍යුත්, මුද්‍රිත, සමාජ ජාල හා අන්තර්ජාල ප්‍රචාරණය හා sabaramarket.lk අන්තර්ජාල අලෙවිජාලය ව්‍යවසායකයින්ට හඳුන්වා දීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>පළාත් අමාත්‍යංශ<br>රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය<br>සමාජ ජාල ක්‍රියාකාරින්<br>වෙබ් අඩවි හරහා |
| 06 | මූල්‍ය පහසුකම් සම්බන්ධීකරණය හා ව්‍යාපෘති වාර්තා පිලියෙල කිරිම. | ව්‍යාපෘති වාර්තා පිලියෙල කිරිමට සහය වීම<br>මූල්‍ය පහසුකම් සම්බන්ධිකරණය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය<br>රාජ්‍ය හා පෞද්ගලික බැංකු ප්‍රධානීන්<br>පළාත් අමාත්‍යංශ ලේකම් වරුන්<br>තාක්ෂණික සේවා සපයන ආයතන |

## 8. ව්‍යාපෘති තිරසාරත්වය

“ආයෝජනයට සබරගමුව” (Invest Sabaragamuwa) වැඩසටහන තිරසාරව ඉදිරියට ක්‍රියාත්මක කිරිම සඳහා පහත පරිදි ක්‍රියාමාර්ග රාශියක් සබරගමුව පළාත් සභාව මඟින් ගැනිමට අපේක්ෂිතය

### i. ව්‍යවසායකයිගේ දායකත්වය ලබා ගැනීම

සම්ප්‍රදායික ව්‍යවසායකත්ව වැඩසටහන් තුල අධාර හා සියලු දේ ව්‍යවසායකයාට ලබාදෙන ක්‍රමවේදයක් පැවතියත්, මෙම වැඩසටහන තුල සැබැවින්ම ඔවුන්ගේ අවශ්‍යතාව හඳුනාගෙන ඔවුන්ගේද ඉහල දායකත්වයක් ඒ තුලට ලබාගනිමින් (50% වඩා වැඩි) කටයුතු කිරිමට සැලසුම් කර ඇත. වෙනත් වැඩසටහන් තුළින් ආවරණය නොවූ අංශ මෙම වැඩසටහන තුළින් ආවරණය කිරිමට සැලසුම් කර ඇත. එබැවින් මෙම වැඩසටහන තුල ව්‍යවසායකයින්ගේ දායකත්වය ඉහල අගයක් ගනු ඇතැයි උපකල්පනය කෙරේ.

### ii. විධිමත් මෙහෙයුම් ක්‍රියාවලියක් සිදු කිරිම.

මෙම වැඩසටහන තුල හඳුනාගත් සම්පත් නිවැරදිව ප්‍රජාව තුලට ගලායනවාද යන්න සොයා බැලිම සඳහා විධිමත් මෙහෙයුම් යාන්ත්‍රණයක් පළාත් සභාව තුල ස්ථාපිත කිරිමට සැලසුම් කර ඇත. පළාත් ව්‍යාවසායකත්ව මෙහෙයුම් කමිටුවක් (Provincial Entrepreneurship Monitoring Committee (PEMC)) ගරු ආණ්ඩුකාරතුමන් ප්‍රධානත්වයෙන් පිහිටුවිමට සැලසුම් කර ඇත. මෙම කමිටුව සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනයට අදාල සියලුම පාර්ශවකරුවන් සහභාගි කර ගැනිමට සැලසුම් කර ඇත. මේ ව්‍යාපෘතියේ සැලසුම් අදියරේ සිට ක්‍රියාත්මක අදියර දක්නා වැඩසටහන් ප්‍රජාව වෙත නිවැරදිව ගලායනවාද යන්න මේ තුළින් අධීක්ෂණයට ලක් කරනු ඇත.

### iii. රැකියා උත්පාදනය හා අදායම් ඉහල යැම.

සැබැවින්ම මෙම වැඩසටහන සාම්ප්‍රදායික ව්‍යවසායකත්ව වැඩසටහන් රාමුවෙන් මිදි හුදෙක් අවශ්‍යතාවය පදනම් කරගත් ව්‍යවසායකයන් වෙත කුසලතා, තාක්ෂණය,

වෙළඳපල, සහතික කරණය අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම හා අපනයනය මූලික කරගත් නිෂ්පාදනය ප්‍රවර්ධනය වැනි අංශ කුලට දායකත්වයක් ලබාදීමට සැලසුම් කර ඇත. මේ තුලින් එම ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන ධාරිතාවය හා ගුණාත්මකතාව ඉහල නැංවීම තුලින් ඔවුනට වෙළඳපල තරගකාරිත්වයට මුහුණදීමට හැකියාව නිර්මාණය කිරිමට කටයුතු කරනු ලැබේ. ඒ හේතු කොට ගෙන ප්‍රාදේශිය රැකියා වියුක්තිය අවම කිරිමට සානු බලයක් සපයනු ඇතැයි විශ්වාස කරනු ලැබේ.

iv. **අර්ථික යටිතල පහසුකම් සංවර්ධනය**

සැබැවින්ම මෙම වැඩසටහන තුල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය (Economic Infrastructure Development) කෙරෙහි මූලික අවධානය යොමුකර ඇත. මූල්‍ය, තාක්ෂණික, වෙළඳපල, බැංකුකරණය, ව්‍යාපාර තුල ඵලදායිතාවය හා ආයතන වැඩිදියුණු කිරිම් වැනි ක්‍රියාවලි සංවර්ධනය කිරිමට සැලසුම් කර ඇත. විශේෂයෙන් මෙම වැඩසටහන තුළින් මීට පෙර රාජ්‍ය සම්පත් ගලා ගිය ව්‍යවසායකයන්ට වඩා ගලා නොගිය එනමුත් ආර්ථික යටිතල පහසුකම් ගලා යායුතු අංශ හඳුනාගැනිමට සැලසුම් කර ඇත.

v. **ආන්තර් ආයතන ඒකාබද්ධතාවය**

මෙම වැඩසටහන සඳහා පළාත් රාජ්‍ය සේවයේ ආයතන මෙන්ම මධ්‍යම රජය සතු තාක්ෂණික ප්‍රවර්ධන ආයතන සහ සම්බන්ධ කර ගැනිමට සැලසුම් කර ඇත. ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටලු වලට පිළියම් සෙවිම හා ආරම්භක අදියර තුල සිටින කර්මාන්ත වලට අවශ්‍ය සානුබලයන් සැපයීමේදි සියලු පාර්ශවයන් ඒකාබද්ධ වූ කමිටුවක් තුලින් හඳුනාගැනිමට ක්‍රියාකරනු ඇත. මේ තුලින් ප්‍රතිලාභ ගලායාමේ ද්විත්ව ගණනය නතර වනු ඇත.

## 9. ක්‍රියාත්මක කිරිම, මෙහෙයවීම, පසුවිමසුම් ක්‍රියාවලිය

ආයෝජනයට සබරගමුව (Invest Sabaragamuwa) වැඩසටහන සබරගමුව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය මඟින් සැලසුම් කරන ක්‍රියාවලිය තුල සබරගමුව පළාතේ පළාත් අමාත්‍යාංශ වන කෘෂිකර්ම, කර්මාන්ත, ප්‍රධාන හා සංචාරක අමාත්‍යාංශ වල ඒකාබද්ධ උත්සහයක් ලෙස හඳුනාගත් ප්‍රධාන ක්‍රියාකාරකම් හා ක්ෂේත්‍ර හරහා ක්‍රියාවට නැංවිමට සැලසුම් කර ඇත.

විශේෂයෙන් මෙම වැඩසටහන ප්‍රධාන ලේකම්තුමියගේ උපදේශකත්වය හා මඟපෙන්වීම ඇතිව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් පසු විමසුම් ක්‍රියාවලියට අදාල අමාත්‍යාංශ ඒකාබද්ධව සිදුකිරිමට යෝජනා කෙරේ. මෙම වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා වඩාත් තාක්ෂණිකව ඉදිරියට රැගෙන යාම සඳහා මෙම වැඩසටහනට ශ්‍රී ලංකාවේ පවතින ඒ ඒ ක්ෂේත්‍ර වලට විශේෂිත වූ තාක්ෂණික ආයතන හා විශේෂඥයින් සම්බන්ධ කරගැනිමට සැලසුම් කර ඇත.

විශේෂයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), කාර්මික තාක්ෂණ ආයතනය (ITI), කුඩා ව්‍යාපාර අංශය (SBD) , නර්ඩ් ආයතනය, හෙක්ටර් කොබ්බැකටුව ගොවිකටයුතු පර්යේෂණ මධ්‍යස්ථානය, රේඛීය කෘෂිකර්ම අමාත්‍යාංශය, සුලු අපනයන භෝග දෙපාර්තමේන්තුව හා බුලත් පර්යේෂණ ආයතනය වැනි තාක්ෂණික හා පර්යේෂණ ආයතනවල සහය ලබාගැනිමට සැලසුම් කර ඇත. එලෙසම මෙම වැඩසටහන කාර්යක්ෂමව හා ප්‍රතිඵලදායීව ක්‍රියාවට නැංවිම සඳහා සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ ප්‍රධානත්වයෙන් පළාත් ව්‍යවසායකත්ව මෙහෙයුම් කමිටුවත් (Provincial Entrepreneurship Monitoring Committee) පහත සඳහන් නිලධාරින්ගේ සහභාගීත්වයෙන් පිහිටුවිමට යෝජිතය.

1. ගරු. ආණ්ඩුකාරතුමා
2. ගරු. ප්‍රධාන අමාත්‍යතුමා
3. ප්‍රධාන ලේකම්තුමිය
4. දිස්ත්‍රික් ලේකම් (කෑගල්ල/රත්නපුර)
5. උපකුලපතිතුමා සබරගමුව විශ්ව විද්‍යාලය
6. ලේකම් පළාත් ප්‍රධාන අමාත්‍යාංශය
7. ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය
8. ලේකම් කර්මාන්ත අමාත්‍යාංශය
9. ලේකම් සංචාරක අමාත්‍යාංශය
10. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන)
11. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
12. සභාපති සබරගමුව වාණිජ මණ්ඩලය
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ, කාර්මික සංවර්ධන මණ්ඩලය (කෑගල්ල/රත්නපුර)
14. සහකාර අධ්‍යක්ෂ (කුඩා ව්‍යාපාර අංශය)
15. දිස්ත්‍රික් විදාතා අධ්‍යක්ෂ (කෑගල්ල/ රත්නපුර)
16. පර්යේෂණ ආයතන වල ප්‍රධානීන්
17. අධ්‍යක්ෂ ජෙනරාල්, අපනයන සංවර්ධන මණ්ඩලය

එලෙසම මෙම පළාත් කමිටුවට අමතරව මෙම ව්‍යවසායකයන් ද්විගණයෙන් තොරව හඳුනාගැනීම සඳහා පහත සඳහන් නිලධාරීන් සැදුම්ලත් තාක්ෂණික කමිටුවක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව
   දිස්ත්‍රික් ලේකම්/ නියෝජිතයෙකු
2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ක්‍රමසම්පාදන
3. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
4. පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ
5. සැලසුම් අධ්‍යක්ෂ, ප්‍රධාන අමාත්‍යාංශය
6. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) කෘෂිකර්ම අමාත්‍යාංශය
7. සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) කර්මාන්ත අමාත්‍යාංශය
8. සහකාර ලේකම් (සංවර්ධන) කර්මාන්ත අමාත්‍යාංශය
9. සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) සංචාරක අමාත්‍යාංශය
10. කුඩා ව්‍යාපාර අංශයේ අධ්‍යක්ෂ (කෑගල්ල/ රත්නපුර)
11. විදාතා දිස්ත්‍රික් අධ්‍යක්ෂ (කෑගල්ල/ රත්නපුර)
12. නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්මික සංවර්ධන මණ්ඩලය (කෑගල්ල/ රත්නපුර)
13. පීඨාධිපති කළමණාකරණ/ කෘෂි විද්‍යා පීඨය සබරගමුව විශ්ව විද්‍යාලය
14. අවශ්‍ය පරිදි ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ උපදේශකවරයෙකු

මේ අනුව පුවත් පත් දැන්වීම් තුලින් හා ප්‍රාදේශීය ලේකම් කෝට්ඨාශ මට්ටමින් ව්‍යවසායකයන් හඳුනාගෙන ඔවුන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා සබරගමුව පළාත් සභාවේ කොන්දේසිවලට යටත්ව ව්‍යවසාය සඳහා හඳුනාගත් ක්ෂේත්‍ර ඉලක්කකොට ගෙන පළාතේ ව්‍යාවසායකයන් වෙත මූල්‍ය හා ප්‍රාග්ධන සානුබලයන් සලසා දීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන වසර 04ක් තුල පළාතේ ව්‍යවසායකයන් 2000ක් කරා අදියර 04 යටතේ ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

**10.** **අපේක්ෂිත පිරිවැය**

| අනු අංකය | ක්‍රියාකාරකම | අපේක්ෂිත පිරිවැය | | |
|---|---|---|---|---|
| | | පළාත් සභාව | මධ්‍යම රජය | පෞද්ගලික ව්‍යවසායකයින් |
| 01 | ව්‍යාපෘති වර්තා සැකසිම/ අනුමැතිය ලබා ගැනිම | 0.01 | | |
| 02 | ව්‍යවසායකයන් 2000ක් හඳුනාගැනිම (අදියර 04 යටතේ) | 03.00 | | |
| 03 | ව්‍යාපාර සේවා මධ්‍යස්ථානයක් පළාත් සභාව තුල ස්ථාපිත කිරිම. | 02 | | |
| 04 | සහතික කරණය/ ප්‍රමිතිකරණය ව්‍යවසායකයන් 200ක් වෙත ලබාදිමට (වසර 04 තුල) | 20 | 10 | 10 |
| 05 | සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ තාක්ෂණික පැවරුම් ක්‍රියාවලිය (වසර 04ක් තුල ව්‍යවසායකයින් 200 වෙත) | 20 | 10 | 10 |
| 06 | අගය එකතු කල නිශ්පාදන දිරිගැන්විම. (ව්‍යවසායකයින් 200 අදියර 04 යටතේ) | 20 | 05 | 05 |
| 07 | විදේශ වෙළදාම ඉලක්ක කරගත් නිශ්පාදන සඳහා සානුබල සැපයිම. (ව්‍යවසායකයින් 200 අදියර 04) | 20 | 05 | 10 |
| 08 | ආනයන ආදේශ කර්මාන්ත සංවර්ධනය හා ආරම්භ කිරිම සඳහා. (ව්‍යවසායකයන් 200ක් සඳහා) | 20 | 05 | 10 |
| 09 | අලෙවිදාම සංවර්ධනය (Business Linkage Development/ සන්නාම කරණය (ව්‍යවසායකයින් 200ක් වෙත අදියර 04 යටතේ) | 20 | 05 | 10 |
| 10 | කාන්තා ව්‍යවසාය සංවර්ධනය කිරිමට (ව්‍යාපාර 500 වසර 04ක් ඇතුලත) | 50 | 10 | 25 |
| 11 | ඇසුරුම්කරණ ක්‍රියාවලි හා ක්‍රියාවලි වැඩිදියුණු කිරිම. (ව්‍යවසායකයින් 200ක් වෙත අදියර 04 යටතේ) | 20 | 05 | 10 |
| 12 | විද්‍යුත්/ මුද්‍රිත, සමාජ ජාල හා වෙබ් අඩවි මඟින් ප්‍රචාරණය | 08 | 01 | 01 |
| 13 | මූල්‍ය ආයතන සම්බන්ධීකරණය හා ව්‍යාපෘති වාර්තා පිළියෙල කර දිමට සහය වීම. | 04 | 01 | 02 |
| 14 | ක්ෂේත්‍ර නිරික්ෂණ හා කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් | 10 | 02 | 01 |
| 15 | සමස්ත වැඩසටහන පසු විමසුම/ ඇගයිම. | 01 | | |
| 16 | සමස්ත දැරිමට අපේක්ෂිත පිරිවැය. ( වසර 04 තුල අදියර 04ක් යටතේ) | 218.01 | 59.00 | 94.00 |

11. ව්‍යාපෘති කාල රාමුව.

ආයෝජනයට සබරගමුව (Invest Sabaragamuwa) ක්ෂුද්‍ර සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කාලරාමුව (2021-2024)

| අනු අංකය | ක්‍රියාකාරකම | 2021 කාර්තු වශයෙන් | | | | 2021 කාර්තු වශයෙන් | | | | 2023 කාර්තු වශයෙන් | | | | 2024 කාර්තු වශයෙන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | I | II | III | IV | I | II | III | IV | I | II | III | IV | I | II | III | IV |
| 01 | ව්‍යාපෘති වර්තා සැකසිම/ අනුමැතිය ලබා ගැනිම | | | | | | | | | | | | | | | | |
| 02 | ව්‍යවසායකයන් 2000ක් හදුනාගැනිම (අදියර 04ක් යටතේ) | | | | | | | | | | | | | | | | |
| 03 | ව්‍යාපාර සේවා මධ්‍යස්ථානයක් පළාත් සභාව තුල ස්ථාපිත කිරිම. | | | | | | | | | | | | | | | | |
| 04 | සහතික කරණය/ ප්‍රමිතිකරණය ව්‍යවසායකයන් 200ක් වෙත ලබාදිමට (වසර 04 තුල) | | | | | | | | | | | | | | | | |
| 05 | සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ තාක්ෂණික පැවරුම් ක්‍රියාවලිය සඳහා වසර 04ක් තුල ව්‍යවසායකයින් 200 වෙත) | | | | | | | | | | | | | | | | |
| 06 | අගය එකතු කල නිශ්පාදන දිරිගැන්විම. (ව්‍යවසායකයින් අදියර 04 යටතේ) | | | | | | | | | | | | | | | | |
| 07 | විදේශ වෙළඳාම ඉලක්ක කරගත් නිශ්පාදන සඳහා සානුබල සැපයිම. (ව්‍යවසායකයින් 200 අදියර 04) | | | | | | | | | | | | | | | | |
| 08 | ආනයන ආදේශ කර්මාන්ත සංවර්ධනය හා ආරම්භ කිරිම සඳහා. (ව්‍යවසායකයන් 200ක් සඳහා) | | | | | | | | | | | | | | | | |
| 09 | අලෙවිදාම සංවර්ධනය (Business Linkage Development/ සන්නාම කරණය (ව්‍යවසායකයින් 200ක් වෙත අදියර 04 යටතේ) | | | | | | | | | | | | | | | | |
| 10 | කාන්තා ව්‍යවසාය සංවර්ධනය කිරිමට (ව්‍යාපාර 500 වසර 04ක් ඇතුලත) | | | | | | | | | | | | | | | | |
| 11 | ඇසුරුම්කරණ ක්‍රියාවලි හා ක්‍රියාවලි වැඩිදියුණු කිරිම. | | | | | | | | | | | | | | | | |
| 12 | විද්‍යුත්/ මුද්‍රිත, සමාජ ජාල හා වෙබ් අඩවි මඟින් ප්‍රවර්ධන සඳහා ව්‍යවසායන් | | | | | | | | | | | | | | | | |
| 13 | මුල්‍ය ආයතන සම්බන්ධීකරණය හා ව්‍යාපෘති වාර්තා පිළියෙල කර දිම. | | | | | | | | | | | | | | | | |
| 14 | ක්ෂේත්‍ර නිරික්ෂණ හා කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් | | | | | | | | | | | | | | | | |
| 15 | සමස්ත වැඩසටහන පසු විමසුම/ ඇගයිම. | | | | | | | | | | | | | | | | |

## 12. සංවර්ධනය කිරිමට හඳුනාගත් ව්‍යාවසායකත්ව ක්ෂේත්‍ර

| ක්ෂේත්‍රය | ආශ්‍රිත කර්මාන්තය |
|---|---|
| • කෘෂි නිශ්පාදන | කාබනික එලවලු වගාව<br>කාබනික පලතුරු වගාව<br>කෝමාරිකා වගාව<br>කාබනික පලාකොටු ඇති කිරිම.<br>මුරුංගා කොල/ විජලනය කර සැපයීම.<br>GAP ක්‍රමය යටතේ එලවලු හා පළතුරු වගාව<br>නිල්කටරොඩු/ වඳමල්/ පිච්චමල් වගාව<br>කොස්/ දෙල්/ එලවලු/ පළතුරු විජලන ව්‍යාපෘති<br>බිම්මල් හා බිම්මල් ආශ්‍රිත නිෂ්පාදන/ බිම්මල් වගාමලු<br>නිෂ්පාදනය, බිම්මල් සොසේජස් කර්මාන්තය<br>පොලොස්, කොහිල, සෝසේජස් නිෂ්පාදනය<br>විසිතුරු අපනයන ඉලක්ක කොටගත් මල් වගාව<br>දේශිය අල වර්ග<br>මයියොක්කා වගාව<br>හරිතාගාර තුල එලවලු, පලා හා පලතුරු වගාව<br>ස්ටෝබෙරි වගාව<br>දේශිය හා වැඩිදියුණු කල බිජ නිශ්පාදනය<br>බඩ ඉරිගු වගාව<br>කාබනික පොහොර කර්මාන්තය<br>එළවලු හා පළතුරු පැල තවාන්<br>නයි මිරිස් වගාව<br>කොලපත් පිඟන් නිෂ්පාදනය<br>කෙසෙල් කොල තුළින් Lunch Sheet නිෂ්පාදනය<br>අපනයන ඉලක්ක කරගත් අන්නාසි වගාව<br>කෝස්/ පොලොස්/ දෙල් වැනි එලවලු අපනයනය කිරිම.<br>මී පැණි හා මී පැණි ආශ්‍රිත නිෂ්පාදන<br>ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන<br>වරකා/ දුරියන්/ මැංගුස් ටිං කිරිම ආශ්‍රිත නිෂ්පාදනය<br>කටු අනෝදා වගාව<br>අපනයනය ඉලක්ක කර කෙසෙල් වගාව<br>පළතුරු යුෂ කර්මාන්තය |
| ධීවර | විසිතුරු මත්ස්‍ය වගාව<br>විසිතුරු ජලජ පැලැටි වගාව (Aqua plant)<br>විසිතුරු ජලජ මල් වර්ග<br>මිරිදිය කරවල සැකසුම් නිෂ්පාදනය |
| ආයුර්වේද | කහ වගාව ප්‍රවර්ධනය<br>ඉඟුරු වගාව<br>දේශීය ඔසුපැන් නිෂ්පාදනය (බෙලිමල්, රණවරා, ඉරමුසු, නීරමුල්ලි වැනි)<br>බිං කොහොඹ/ කිරාත වගාව<br>ප්‍රාණ ජීව හා දේශීය ඖෂද ශාක වගාව. ( හීං ආත්තා, යකි නාරං, අංකෙන්ද)<br>දේශීය කොළ කැඳ වර්ග<br>සාම්ප්‍රදායික වෛද්‍යවරුන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය |
| පොල් හා පොල් ආශ්‍රිත | - පොල් ලෙලි කැපිම<br>- පොල් කටු තුලින් සක්‍රිය කාබන් නිෂ්පාදනය<br>- විසිතුරු නිෂ්පාදන සැකසීම |

| | |
|---|---|
| | - කොහු නිෂ්පාදන<br>- කොහුබත් කුට්ටි සැකසීම.<br>- ඉරටු ආශ්‍රිත නිෂ්පාදන<br>- පොල් විනාකිරි නිෂ්පාදනය<br>- පොල්තෙල් නිෂ්පාදනය<br>- පොල් කිරි නිෂ්පාදනය<br>- පොල්පැණි නිෂ්පාදනය<br>- තැඹිලි අපනයනය |
| කිතුල් ආශ්‍රිත නිෂ්පාදන | - කිතුල් හකුරු නිෂ්පාදනය<br>- කිතුල් පැණි නිෂ්පාදනය<br>- කිතුල් චොකලට් නිෂ්පාදනය<br>- කිතුල් ජෑම් නිෂ්පාදනය (මාමලේට්)<br>- තෙලිදිය නිෂ්පාදන<br>- කිතුල් විනාකිරි නිෂ්පාදන<br>- කිතුල් පිටි නිෂ්පාදනය<br>- විසිතුරු නිර්මාණ<br>- මියගිය කිතුල් ශාක තුලින් විසිතුරු ලී නිෂ්පාදනය<br>- කිතුල් සිනි නිෂ්පාදනය |
| කුලුබඩු ආශ්‍රිත නිෂ්පාදන | - කුලුබඩු ආශ්‍රිත පැල තවාන්<br>- කුලුබඩු කුඩු කිරිම<br>- ගම්මිරිස් සැකසුම් මධ්‍යස්ථාන<br>- කුරුඳු නිෂ්පාදන<br>- කුරුඳු තේ නිෂ්පාදන<br>- දේශීය රසකාරක හඳුන්වා දීම<br>- රම්පෙ/ කරපිංචා විජලනය කර අපනයන වගාව |
| තේ ආශ්‍රිත නිෂ්පාදන | තේ කොල පැකට්<br>තේ කොල ටි බැග් නිෂ්පාදනය<br>තේ සමඟ ඖෂධීය ශාක මිශ්‍රකර තේ බැග් නිෂ්පාදනයට<br>තේ කැට නිෂ්පාදනයට<br>කාබනික තේ දළු නිෂ්පාදනය<br>කාබනික තේ නිෂ්පාදනය (Hand Made tea) |
| ඉන්ධන බලශක්ති (සූර්ය බල) | ගිරිසිරියා වගාව ප්‍රවර්ධනය<br>විකල්ප බලශක්ති නිෂ්පාදනය |
| සංචාරක | පරිසර හිතකාමි නවාතැන් සංවර්ධනය (camping/ Tree House)<br>Day tours ප්‍රවර්ධනය<br>සංචාරක නවාතැන්පල හා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය<br>ආපනශාලා හා දේශීය ආහාර ප්‍රවර්ධනය<br>දේශිය රසකැවිලි නිෂ්පාදනය |
| තොරතුරු තාක්ෂණ | අන්තර්ජාල E Marketing<br>අන්තර්ජාල ව්‍යාපාර ව්‍යාපාර බාහිරකරණ ක්‍රියාකාරකම්. (Business Process Outsource - BPO)<br>තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන<br>වෙබ් අඩවි/ සමාජ මාධ්‍ය අලෙවිකරණය/ අන්තර්ජාල නිර්මාණය |
| පාංශු සම්පත් | මී කිරි නිෂ්පාදනය<br>විස් බටර් නිෂ්පාදනය<br>කල්කිරි නිෂ්පාදනය<br>අයිස් පැකට්/ රසකල කිරි බෝතල් කිරිම |
| දැව නිර්මාණ | දැව ආශ්‍රිත නිෂ්පාදන |

| | |
|---|---|
| | දැව ආශ්‍රිත විසිතුරු නිර්මාණ |
| මැටි නිෂ්පාදන | මැටි භාජන නිෂ්පාදනය<br>මිකිරි හට්ටි නිෂ්පාදනය<br>මැටි ආශ්‍රිත ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය<br>මැටි ආශ්‍රිත විසිතුරු නිර්මාණ<br>අපනයන ඉලක්ක කරගත් මැටි නිෂ්පාදන<br>මැටි ආබරණ |
| ආහාර | • ජෑම් වර්ග නිෂ්පාදනය<br>• චට්නි වර්ග නිෂ්පාදනය<br>• අච්චාරුවර්ග නිෂ්පාදනය<br>• බයිට් වර්ග නිෂ්පාදනය<br>• කෙසෙල් බයිට් වැනි දේශීය ද්‍රව්‍ය යොදාගෙන කරුනු ලබන නිෂ්පාදන<br>• කිරි ආශ්‍රිත රසකැවිලි<br>• බිස්කර් වර්ග නිෂ්පාදනය<br>• අයිස් ක්‍රීම් වර්ග නිෂ්පාදනය<br>• දේශීය රසකැවිලි නිෂ්පාදනය<br>• දේශිය ආහාර වර්ග නිෂ්පාදනය |
| රුපලාව්‍ය නිෂ්පාදන | දේශීය ශාක වලින් රුපලාවන්‍ය නිෂ්පාදන<br>හිසකේ අලේපන (තැඹිලි තෙල්/ නිය ආලේපන තෙල් වර්ග) |
| ඛනිජ ආශ්‍රිත නිර්මාණ | ගෙවුඩ පිලිස්සීමේ රසායනාගාර<br>ඛනිජ ආශ්‍රිත ස්වර්ණාභරණ නිෂ්පාදනය<br>අපනයන ආශ්‍රිත ඛනිජ වර්ග නිෂ්පාදනය<br>මැණික් හා මැණික් ආශ්‍රිත නිෂ්පාදන |
| කසල කලමණාකරණය | • කසල ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථාන<br>• පොලිතින්/ ප්ලාස්ටික් කුඩු/ කැබැලි අලෙවිකිරිම.<br>• කඩදාසි/ පත්තර/ කාඩ්බෝඩ් ප්‍රතිචක්‍රිකරණය<br>• කසල එකතුකිරිමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.<br>• ප්ලාස්ටික් පොලිතින් වලින් බිම් ඇතුරුම් ගල් නිෂ්පාදනය |
| අධ්‍යාපනික උපකරණ හා ක්‍රිඩා භාණ්ඩ නිෂ්පාදනය | අධ්‍යාපනික උපකරණ නිෂ්පාදනය<br>ක්‍රිඩා භාණ්ඩ නිෂ්පාදනය |
| ඇගලුම් නිෂ්පාදනය | උප කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ඇගලුම් නිෂ්පාදනය<br>අපනයන ඉලක්ක කරගත් ඇගලුම් කර්මාන්තශාලා ඇති කිරිම.<br>ගෘහ භාණ්ඩ ඇසුරුම් නිෂ්පාදනය |
| කර්මාන්ත | අත්යන්ත්‍ර නිෂ්පාදනය<br>රෙදි ආශ්‍රිති නිෂ්පාදන<br>දේශීය ද්‍රව්‍ය උපයෝගීකොටගත් නිෂ්පාදන<br>ඌණ ආශ්‍රිත නිෂ්පාදන<br>පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන<br>රන්, තඹ, පිත්තල ආශ්‍රිත නිෂ්පාදන<br>මැෂින් ආශ්‍රිත නිෂ්පාදන<br>මැටි ආශ්‍රිත නිෂ්පාදන |
| වෙනස් නිෂ්පාදන | ඉහත ක්ෂේත්‍ර වලට අයත් නොවුවත් ව්‍යාපෘතිය ආවරණය වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම. |